**ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**
**-----------------------------------------------------------------------------------------**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1, 3.1.2 හා 3.1.3. වගුවල ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 2 ක්ද සුරාබදු දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

### 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමණාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම.
**-----------------------------------------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ

### 1.3 විගණන විෂය පථය
**------------------------**

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමණාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛණ, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙළ කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2018 ජූලි මස 12 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තා පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණ

------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතු භාවය | | ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධානයට අනුගත නොවීම | නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම.<br>2. අධි ප්‍රතිපාදන<br>3. ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීමේ අඩුපාඩු<br>4. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම.<br>5. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්<br>6. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු<br>7. තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟා වීම.<br>8. අභ්‍යන්තර විගණනයේ අඩුපාඩු | 2.2<br>2.7<br>2.1.1<br>2.1. 2 (අ)(ආ)<br>2.1. 2(ඇ)<br>2.2<br>2.1.2 (ඇ)<br>2.14 |
| 128(1)(ආ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම.<br>2. අනුකූල නොවීම් | 2.12<br>2.13 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වාගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් හා විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සංත්‍යාක්ෂණය කරනු ලන බවටත් ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිශ්කාෂණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු<br>2. පාඩු හා හානි | 2.3<br>2.4 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. කළමනාකරණ දුර්වලතා<br>2. මතභේදයට තුඩුදෙන ගනුදෙනු | 2.5<br>2.6 |

**මුදල් රෙගුලාසි 128 (2) රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතු භාවය**

--------------------------------------------------------------------------

**මුදල් රෙගුලාසි**

------------------

| | | | |
|---|---|---|---|
| 128 (2)(එ) | අවශ්‍ය තන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්වයන්ගෙන් වෙනස්වීම් ගැන සැලකිලිමත්ව, කලින් කල වරිපනම් හා අයකිරීම් හෝ බදු සහ ගාස්තු ආදිය අයකිරීම් සමාලෝචනය කර ඒවා ප්‍රතිශෝධනය කිරිමට නිසි පියවර ගන්නා බව. | ආදායම් විචලනය සම්බන්ධයෙන් බලපෑ කරුණු පිළිබඳ විශ්ලේෂණය නොකිරීම. | 2.8 (අ)(ආ) |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

**2.1 කාර්යසාධනය**

------------------

**2.1.1 සැලැසුම් කිරීම**

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙළ කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති සුරාබදු තෑගි අරමුදලේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 5 මඟින් අපේක්ෂිත ග්‍රහණයන් පිළිබඳව පමණක් සැලැස්මට ඇතුළත් කර තිබූ අතර දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රධාන කාර්යයන් 16 ක් පැවතුනද එම කාර්යයන් ඉටු කිරීමට අදාල ක්‍රියාකාරකම් සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අත්මුදල් අවශ්‍යතා සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

--------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයන් 8 න් කාර්යභාරයන් 5 ක් පමණක් ඉටු කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රසම්පාදනයන් සැලැසුම් කළ පරිදි ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රධාන කාර්යයන් 3ක් සඳහා වෙන්කරන ලද රු.මිලියන 111 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

--------------------------------------

සුරාබද්ධට (මත්පැන්) අදාළව සමාලෝචිත වර්ෂයේ සහ පූර්ව මුදල් වර්ෂ 3 ක් සඳහා රැස් කරන ලද ශුද්ධ ආදායම පරීක්ෂාවේදී 2015 සහ 2016 වර්ෂවල පිළිවෙළින් සියයට 52 කින් සහ සියයට 14 කින් ආදායම වැඩි වී තිබූ අතර 2017 වර්ෂයේදී සියයට 6 කින් අඩු වී තිබුණි.

(ඇ) **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

-------------------------------

දෙපාර්තමේන්තුව විසින් හලාවත, අම්පාර සහ මහනුවර ප්‍රාදේශීය කාර්යාල ඉදිකිරීම් සඳහා එකතුව රු. මිලියන 191.83 ක් ඇස්තමේන්තු වටිනාකමක් මත 2018 මාර්තු මස වනවිට නිමකිරීමට අපේක්ෂිතව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2017 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 81.66 ක් වැයකර තිබූ අතර කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ රු.මිලියන 42.81 ක බිල්පත් සඳහා මුදල් නොගෙවීම නිසා ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි.

(ඈ) **තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම**

------------------------------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කර ගත යුතු අරමුණු සහ ඉලක්ක කරා ළඟා වීම පිළිබඳ දෙපාර්තමේන්තුව දැනුවත්ව නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කිරීමට කටයුතු සිදු කර නොතිබුණි.

**2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජුනි 30 දින වන විටත් සභාගත කර නොතිබුණි.

**2.2 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම**

--------------------------------

සැපයීම් හා සේවා සඳහා සලසා තිබුණු රු.මිලියන 282 ක ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙළ කළ ප්‍රසම්පාදන සැලසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන සැලසුම් කිරීමේදී පිරිවිතර, සැලසුම් කාල රාමුව යනාදිය පිළියෙළ කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.6,350,000 ක නිල ඇඳුම්, රෙදි හා පාවහන් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2017 මාර්තු හා මැයි මස වන විට අවසන් කළ යුතු වුවත් 2017 ඔක්තෝබර් 10 දින වන විටද මිල ගණන් කැඳවීම පමණක් සිදු කර තිබුණි.

(ඇ) 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ගොඩනැගිලි, වාහන, ලී බඩු හා කාර්යාල උපකරණ සහ පුහුණුවීම්වලට අදාල ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂයේ තෙවන කාර්තුව අවසාන වන විටත් සිදු කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ආරක්ෂිත ස්ටිකරය සැපයීම සඳහා රු.228,203,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර මුදල් අමාත්‍යාංශය විසින් මෙයට අදාල ප්‍රසම්පාදන වටිනාකම රු. 1,782,624,000 ක් ලෙස සියයට 681 කින් වැඩිවනසේ ඇස්තමේන්තු කර තිබුණි

**2.3 වත්කම් කළමනාකරණය**

**-------------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම**

**---------------------------------------------------------------------------**

භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් නිර්දේශ කරනු ලැබූ ධාවනයෙන් බැහැර ව තිබූ අබලි වාහන 9 ක අපහරණය කිරීමේ කටයුතු 2018 ජූනි මස වන විටත් සිදුකර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ අංශ කිහිපයක් ඇතුළු කාර්යාල ස්ථාන 22 ක සමීක්ෂණ වාර්තා 2018 අගෝස්තු 15 දින වනවිටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.4 පාඩු හා හානි**

**----------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය, මත්පැන් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය සහ බදු ගණනය කිරීමේ ක්‍රියාවලිය කළමණාකරණය කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීමේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා 2017 වර්ෂයේදී රු. 128,000 ක් (දැන්වීම් ගාස්තු හා සංග්‍රහ වියදම්) වැය කර තිබුණි. ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කමිටුව විසින් මෙය උපදේශක සේවා ප්‍රසම්පාදනයක් ලෙසට නිරීක්ෂණ කර ඒ අනුව නැවත මිල ගණන් කැඳවීමට තීරණය කර තිබීම හේතුවෙන් වැයකල මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) මත්පැන් බෝතල් හා මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ආරක්ෂිත ස්ටිකර් සැපයීම, ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතියක් සැපයීම, ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම සඳහා වූ

ප්‍රසම්පාදනය දෙපාර්තමේන්තුව විසින් සිදු කර අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතියද ලබා දී තිබුණි. එසේ වුවද 2016 දෙසැම්බර් 08 දිනැති අංක 16/2556/719/153/TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තෝරා ගත් ලංසුකරු, පිළිගත් බද්ධ ව්‍යාපාරයක් ලෙස සැලකීමට අවශ්‍ය නීතිමය අවශ්‍යතා සපුරා නොමැති හෙයින් ප්‍රතික්ෂේප කර නැවත ලංසු කැඳවීමට අනුමැතිය දී තිබුණි. ඒ අනුව නැවත අමාත්‍යාංශය ලංසු කැඳවීම මඟින් ඉහත ලංසුකරුම තෝරා ගැනීම සිදු කර තිබූ අතර මුල් අවස්ථාවේදී ඉහත ලංසුකරු ස්ටිකර් 1000 ක් සඳහා ඉදිරිපත් කර තිබූ මිල ඇමරිකන් ඩොලර් 3.19 ක් වුවද දෙවන ලංසු කැඳවීමේදී ඉදිරිපත් කර තිබූ මිල ඇමරිකන් ඩොලර් 5.99 ක් වීම හේතුවෙන් ස්ටිකර් 1000 ක් සඳහා ඇ.ඩො. 2.80 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව පළමු වසර සඳහා ස්ටිකර් මිලියන 384 ක් වෙනුවෙන් සිදු විය හැකි පාඩුව දළ වශයෙන් ඇ.ඩො. 1,075,200 ක් (රු.මිලියන 166.65 ක් පමණ) වන බව නිරීක්ෂණය විය.

## 2.5 කළමණාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2016 ජනවාරි 26 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් (COPA) දෙපාර්තමේන්තුව සඳහා නව පරිගණක දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබුණු අතර එමඟින් සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ අන්තර් සබඳතා ජාලගත කිරීමක් අපේක්ෂා කර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විටත් මෙම පරිගණක දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) රජයේ ආදායම් වර්ධනය කිරීම සඳහා වූ මත්පැන් බෝතල් හා මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ආරක්ෂිත ස්ටිකර් සැපයීම හා ආරක්ෂිත ස්ටිකර් කළමණාකරණ පද්ධතියක් සැපයීම හා ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යෑම සඳහා වූ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් රු. 1,597,559 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර ඇතත් 2016 වර්ෂයේ අයවැය යෝජනාව, 2018 ජූලි 12 දින වන විටත් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2015 මැයි 21 දින ස්කාගාර සමාගමක් සම්බන්ධයෙන් සිදුකරන ලද සුරාබදු පරීක්ෂණයකදී හෙළිදරව් වූ වැරදි වෙනුවෙන් රු.50,620,739 ක බදු මුදලක් එම ස්කාගාර සමාගම 2015 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවිය යුතු බවට සුරාබදු කොමසාරිස් විසින් නිවේදනයක් මඟින් දන්වා තිබුණි. එම නිවේදනයට සමාගම විසින් දක්වා තිබූ විරෝධතාවලට දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ කමිටු පත් කර තිබුණි. එම කමිටුවලින්ද අදාල මුදල අය කළ යුතු බවට නිර්දේශ කර තිබුණද 2018 ජූනි මස වන විටත් අදාල මුදල් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඈ) නීති විරෝධී ලෙස ස්ප්‍රීතු ආනයනය කරන ලද සමාගමක් සම්බන්ධයෙන් රේගු පරීක්ෂණයට අමතරව දෙපාර්තමේන්තුවෙන්ද පරීක්ෂණයක් පවත්වා තිබූ අතර එම පරීක්ෂණයෙන් රු.588,900,344 ක බදු මුදලක් සමාගමෙන් අයකර ගත යුතුව ඇති බවට 2016 ජනවාරි 13 දිනැති කමිටු වාර්තාව මඟින් තීරණය කර තිබුණ ද එම මුදල් 2017 ජනවාරි මස වන විටත් අයකර ගෙන නොතිබුණි. අමාත්‍යවරයා විසින් මෙම මුදල මාසික වාරිකය රු.15,391,208.75 බැගින් වාරික 30 කින් අය කිරීමට අනුමැතිය ලබා දී තිබුණද එම තීරණය සුරාබදු ආඥා පනතේ (සංශෝධිත) 22 සහ 32 (2) වගන්ති වලට අනුකූල ද යන්න ප්‍රශ්නගත කරුණක් විය .

## 2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2017 මාර්තු 10 දිනැති අංක 2009/45 දරන ගැසට් පත්‍රය මඟින් නිකුත් කර ඇති අංක 995 දරන සුරාබදු නිවේදනයේ 4 නියමය ප්‍රකාරව ආනයන අවසර පත්‍රයක් නොමැතිව කිසිදු මත්පැන් වර්ගයක් ආනයනය නොකළ යුතු බව අවධාරණය කර තිබුණි. එසේ වුවද එම නිවේදනයේ 5 නියමය ප්‍රකාරව ආනයන අවසර පත්‍රයක් නොමැතිව මත්පැන් ආනයනය කරනු ලැබුවහොත් බද්දට අමතරව මි.ර.ගැ. වටිනාකම මත සියයට 3 ක අධිභාරයක් අය කිරීමට හෝ ආනයනය කරනු ලබන මත්පැන් තොගය රාජසන්තක කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට හැකි බව සඳහන්ව තිබුණි. මේ අනුව නීති විරෝධි ලෙස ආනයනය කරනු ලබන මත්පැන් සඳහා සියයට 3 ක අධිභාරයක් ගෙවා නිදහස් කරගත හැකි වීම ලිහිල් කොන්දේසියක් වන හෙයින් එමඟින් ආනයනයන්ගේ පාලනයක් සිදුවේද යන්න විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. සිදු කරන ලද නියැදි පරීක්ෂණයට අනුව 2017 මාර්තු 22 සිට ජුනි 22 දක්වා කාලය තුළදී එසේ අවසරයකින් තොරව සමාගම් 4 ක් විසින් අවස්ථා 7 කදී ආනයනය කරන ලද මත්පැන් ප්‍රමාණය ලීටර් 35,851.3 ක් සඳහා සියයට 3 ක අධිභාරයක් අයකර තිබුණි.

(ආ) ස්ථානීය පිහිටීම පිළිබඳ ඉදිරිපත් කර තිබූ මිනින්දෝරු සැලැස්ම අනුව මීටර් 169.98 ක් දුරින් පාසැලක් පිහිටා ඇති බව සඳහන්ව තිබියදීත් ස්ථානීය පරිභෝජනය සඳහා සම්පූර්ණ විය යුතු නියමිත දුර ප්‍රමාණය යන කොන්දේසි සම්පූර්ණවීමකින් තොරව තිස්සමහාරාමයේ සිනමා ශාලාවක් සඳහා සැර විදේශ මත්පැන් හා අරක්කු බලපත්‍රයක් ලබා දීමට කටයුතු කර තිබුණි.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 5 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන | උපයෝජනය රු.මිලියන | ඉතිරිය රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 493.96 | 492.52 | 1.44 | 0.29 |
| | මූලධන | 174.50 | 172.22 | 2.28 | 1.30 |
| | එකතුව | 668.46 | 664.74 | 3.72 | 0.55 |
| 2014 | පුනරාවර්තන | 547.95 | 547.86 | 0.09 | 0.01 |
| | මූලධන | 182.50 | 150.42 | 32.08 | 17.57 |
| | එකතුව | 730.45 | 698.28 | 32.17 | 4.40 |
| 2015 | පුනරාවර්තන | 666.62 | 665.08 | 1.54 | 0.23 |
| | මූලධන | 387.91 | 147.46 | 240.45 | 61.98 |
| | එකතුව | 1054.53 | 812.54 | 241.99 | 22.94 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 745.66 | 743.09 | 2.57 | 0.34 |
| | මූලධන | 326.77 | 240.88 | 85.89 | 26.28 |
| | එකතුව | 1072.43 | 983.97 | 88.46 | 8.24 |
| 2017 | පුනරාවර්තන | 1039.50 | 806.51 | 232.99 | 22.41 |
| | මූලධන | 272.52 | 160.36 | 112.16 | 41.15 |
| | එකතුව | 1312.02 | 966.87 | 345.15 | 26.3 |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම**

**--------------------------------------------------**

(i) නිෂ්පාදන නියාමන සහ ස්වයංක්‍රීය බදු ගණනය කිරීමේ පද්ධතිය ක්‍රියාවට නැංවීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.මිලියන 18.6 ක ප්‍රතිපාදන අනුමත කරවා ගෙන තිබුණද එම ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයන් 6 ක් සඳහා එකතුව රු. මිලියන 452 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්වලින් උපයෝජනය කල පසු ඉතිරිය රු.මිලියන 307 ක් වී තිබුණි. ඒ අනුව, වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 94 දක්වා පරාසයක ප්‍රමාණවලින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.8 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

**----------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 2 ක් සඳහා එකතුව රු.මිලියන 115,035 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 113,259 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 98 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2017 දෙසැම්බර් 31 දිනට | | | රැස්කළ ආදායම ඇස්තමේන්තු කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම<br>රු. මිලියන | තථ්‍ය ආදායම<br>රු. මිලියන | ඉක්ම වීම (ඌනතාවය)<br>රු.මිලියන | |
| 10.02.04.01 | 115,000.00 | 113,214.00 | (1786.00) | 98 |
| 10.02.06.00 | 35.00 | 45.75 | 10.75 | 130 |

ඉ
හත සඳහන් ආදායම් ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **10.02.04.01** දරන ආදායම් සංකේතය **- සුරාබද්ධ (මත්පැන්)**

**----------------------------------------------------------------------**

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දී සැර මත්පැන් නිෂ්පාදනය අඩු වීම නිසා වර්ෂය ආරම්භයේ පිළියෙල කර තිබුණු ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. නමුත් 2017 නොවැම්බර් මාසයේ සිට මත්පැන් සඳහා අයකරනු ලබන බදු ප්‍රමාණය වැඩිකර තිබුණත් ඒ අනුව වැඩිවන ආදායම පරීක්ෂා කර ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 1,233.16 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 05 ක් අතර කාල පරාසයකට අදාල විය. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(iii) ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම අඩු වීම රු.මිලියන 7,024 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- නිෂ්පාදනාගාරයක නිපදවනු ලදුව ඉන් නිකුත් කරනු ලබන්නා වූ සම්මත සැර මධ්‍යසාර මත්පැන් ලීටරයක් වෙනුවෙන් රු. 1,850 ක බදු මුදලක් අය කිරීමේ ප්‍රතිපත්තිය, 2017 අයවැය යෝජනා අනුව 2017 නොවැම්බර් මස සිට සෑම ලීටරයකට රු. 3,300 ක් වන බද්ධක් ලෙස වෙනස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය ලීටර් මිලියන 8.6 කින් අඩු වී තිබුණි.

- නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන්වල නිරපේක්ෂක සැර සියයට 5 සහ ඊට වැඩි නම් සෑම ලීටරයකටම රු. 315 ක බද්ධක් ද නිරපේක්ෂක සැර සියයට 5 ට අඩු වන්නේ නම් සෑම ලීටරයකටම රු. 190 ක් වන බද්දක් අය කිරීමේ ප්‍රතිපත්තිය, 2017 අයවැය යෝජනා අනුව 2017 නොවැම්බර් මස සිට නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් මධ්‍යසාර සෑම ලීටරයකටම රු. 2,400 ක් වන බද්ධක් ලෙස සංශෝධනය වියයුතු බවට තීරණය විය. එම නිසා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ධාන්‍ය මත්පැන් බදු ආදායම රු. මිලියන 2,795 කින් වැඩිවී තිබුණද ඒවායේ නිෂ්පාදනය ලීටර් මිලියන 3.7 කින් අඩු වී තිබුණි.

(ආ) **10.02.06.00 දරන ආදායම් සංකේතය - දුම්කොළ බද්ද**

**-----------------------------------------------------------**

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දුම්කොළ බදු ආදායමේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 35 ක් වූ අතර තථ්‍ය ආදායම රු. මිලියන 45.74 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආනයනික සිගරට් හා දුම්කොළ බදු ආදායම රු. මිලියන 6 කින් වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් සිගරට් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන අතර අපනයනය කල බවට වාර්තා කර ඇති ප්‍රමාණය සත්‍ය වශයෙන් අපනයනය කර ඇති ද යන බව තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

(iii) 1999 අංක 08 දරණ දුම්කොළ බදු පනතේ 2 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම සිගරට්ටුවක්ම, සුරුට්ටුවක්ම, බීඩියක්ම සඳහා සහ සෑම පයිප්ප දුම්කොළ කිලෝග්‍රෑමයක් සඳහාම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ඒ ඒ අනු ප්‍රමාණය අනුව වූ බද්දක් පනවා අය කරනු ලැබිය යුතුය. එසේ වුවත්, දෙපාර්තමේන්තුව විසින් දුම්කොළ බද්ද අය කරනු ලබන්නේ සිගරට් සඳහා පමණි. මේ අනුව දෙපාර්තමේන්තුව විසින් දුම්කොළ බදු පනතට අනුකූලව කටයුතු නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 24801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 45.00 | 44.57 | 34.00 | 34.43 | 177.00 | 140.08 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම, හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,783,872 ක් වූ විය. එම හිඟ හිටි ශේෂය තුල රු.1,047,185ක් වර්ෂ 1 සිට 5 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු අතර රු.543,714 ක ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**2.10 පොදු තැන්පත් ගිණුම්**

වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු.මිලියන 2.34 ක් වූ තැන්පතු 45 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 6 ක් ඉක්මවූ රු. 16,866 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.12 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛණ පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛණ විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

**2.13 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) සහ104 (4) ප්‍රකාරව පිළියෙල කළ යුතු වාර්තා 2018 අගෝස්තු 15 දින වන විටත් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.14 අභ්‍යන්තර විගණනය**

ගණන්දීමේ නිලධාරී විසින් තම දෙපාර්තමේන්තුවේ මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරි හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු බව මුදල් රෙගුලාසි 133 මඟින් අවධාරණය කර ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් කටයුතුවලට අදාළ පිළියෙළ කර තිබුණු අභ්‍යන්තර විගණන වැඩසටහනේ ඇතුළත්ව තිබුණු සුරාබදු ආදායම රැස් කිරීම, අග්‍රිම ගිණුම පරීක්ෂාව, තැගි අරමුදල පරීක්ෂාව, වත්කම් කළමණාකරණය යන කාර්යභාරයන් ඉටු කර නොතිබුණි.

(ආ) ගිණුම් හා වාර්තාවල විශ්වාසනීයත්වය නිශ්චය කිරීම සහ යොදාගෙන ඇති ගිණුම්කරණ පිළිවෙල මඟින් නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය විසින් අඛණ්ඩ අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකළ යුතු නමුත් එසේ සිදුකර නොතිබුණි.

**2.15 මානව සම්පත් කළමණාකරණය**

**2.15.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත වූ තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 656.786 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.491,974 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 66 | 40 | 26 | - |
| (ii) | තෘතියික මට්ටම | 380 | 342 | 38 | - |
| (iii) | ද්විතියික මට්ටම | 868 | 790 | 106 | 28 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 172 | 163 | 09 | - |
| | එකතුව | 1,486 | 1,335 | 179 | 28 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ මෙහෙවරට සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටම්වල තනතුරු 64 ක් 2015 සහ 2016 වර්ෂවල සිට පුරප්පාඩුව පැවතුණි. එසේ දැනට සේවා නියුක්ත නිලධාරීන්ගෙන් වැඩි දෙනෙක් විශ්‍රාම යාමට ආසන්නව සිටීම දෙපාර්තමේන්තුවේ ඉදිරි කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය.

(ආ) සුරාබදු නියාමක අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්ම වූ අතිරික්ත නිලධාරීන් 28 දෙනෙකු සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ සුරාබදු සැරයන් තනතුර සඳහා අනුමත සංඛ්‍යාව 100 ක් වුවද 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ විවිධ හේතූන් නිසා පුරප්පාඩු වූ තනතුරු 85 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

### 2.15.2 කාර්ය මණ්ඩල පුහුණු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත 1335 කාර්ය මණ්ඩලයේ සියයට 47 කට අධික සංඛ්‍යාවක් සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 8 ක හෝ පුහුණුවක් ලබා දී නොතිබෙන නිරීක්ෂණය වීය.

(ආ) මෙහෙවර කෙරේ ළඟාවීම සඳහා දෙපාර්තමේන්තු ගත සේවකයින්ට අවශ්‍ය විෂයානුබද්ධ දැනුම, පුහුණුව ලබා දීම තුළින් ඉහළ කාර්ය සාධනයක් අත්පත් කර ගැනීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබෙන බව නිරීක්ෂණය වීය.